# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 36 දරන මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 ජූලි මස 27 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජූලි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2000 අංක 36 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 27 වන දින]

එල්.ඩී..–ඕ.15/98.

### 1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2000 අංක 36 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 1963 අංක 11 දරන පනතේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඇ) අවස්ථාවෝචිත පරිදි, මුල් අයිතිකරු, කලත්‍රයා හෝ පැවතෙන්නා විසින් ඉල්ලීම කරන ලද්දේ යම් දිනයක ද, ඒ දිනයට ඉහතින් ම වූ අවුරුදු තුන සඳහා, ආදායම් බදු පැනවීමට අදාළ ලිඛිත නීතියේ විධිවිධාන යටතේ ගණන් බලන ලද –

(i) මුල් අයිතිකරු විසින් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, මුල් අයිතිකරුගේ සහ මුල් අයිතිකරු ප්‍රධානියා වන පවුලේ වෙනත් සාමාජිකයන්ගේ වාර්ෂික සාමාන්‍ය ව්‍යවස්ථාපිත ආදායම ; හෝ

(ii) මුල් අයිතිකරුගේ කලත්‍රයා හෝ යම් පැවතෙන්නකු විසින් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, ඒ කලත්‍රයාගේ සහ මුල් අයිතිකරුගේ වෙනත් පැවතෙන්නන්ගේ වාර්ෂික සාමාන්‍ය ව්‍යවස්ථාපිත ආදායම,

රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන බවට බැංකුව සෑහීමට පත්වන්නේ නම් මිස" ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(3අ) (3) වන උපවගන්තිය යටතේ තීරණයක් කිරීමේ කාර්ය සඳහා, බැංකුව විසින් පත් කරනු ලබන පරීක්ෂණ නිලධරයකු මගින් ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට බැංකුව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය. බැංකුව විසින් පත් කරනු ලබන පරීක්ෂණ නිලධරයා විසින්, ඉල්ලීම අදාළ වන පරිශ්‍රයේ අයිතිකරුට සහ ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන තැනැත්තාට, පුද්ගලිකව හෝ තත් කාර්යය සඳහා බලය දෙන ලද අනුයෝජිතයකු මගින් කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දිය යුතු අතර, මේ සඳහා –

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට බලකිරීම ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බලකිරීම ; සහ

(ඇ) සාක්ෂිකරුවන්ට යම් දිවුරුමක් දීමට හෝ ප්‍රතිඥාවක් කිරීමට සැලැස්වීම,

සඳහා දිසා අධිකරණයකට ඇති සියලු බලතල පරීක්ෂණ නිලධරයාට තිබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.